

# 08.සත්ත්ව පාලනය

ගවයින් ඇති කිරීමේ ක්‍රම
ගව නිවාස
ගව දෙනුන් පාලනය




**H.K.S.P.Kumarasinghe**
**(BASc.Sp (Animal Science)**
**R/Egoda Waleboda Vidylaya**
**R/Samanpura Siddhartha Vidyalaya**

# ගව පාලනය

- ගවයින් ඇති කිරීමේ ක්‍රම

ශ්‍රී ලංකාවේ ගවයන් ඇති කිරීම ප්‍රධාන ආකාර තුනකට සිදු කරනු ලබයි

- නිදැලි ක්‍රමය
- අඩ සියුම් ක්‍රමය
- සියුම් ක්‍රමය

# නිදැලි ක්‍රමය(Free Range System)

- ශ්‍රී ලංකාවේ වියලි කලාප ප්‍රදේශවල
- ඉඩම් සුලභව ඇති ප්‍රදේශ වල පමණි
- වැව පිටි පුරන් කුඹුරු ලඳු කැලෑ ආදී ප්‍රදේශයේ සුලභ ඕනෑම ඉඩමක් භාවිත කල හැකිය. රාත්‍රී කාලයේ දී ද

- කිරි දෙවීම ද එළිමහනේදී ම සිදු කරනු ලබයි
- මෙහි දී උලා කෑම සඳහා විශාල භූමි ප්‍රමාණයක් අවශ්‍ය වන අතර වෙන් වෙන්ව සතුන්ට අවශ්‍ය පෝෂණය කළමනාකරණය කිරීම අපහසුය
- සතුන්ට රුචිකත්වය අනුව උලා කෑම සිදු කළ හැකි වීම වාසියකි



දිවා කාලයේ සතුන් නිදැල්ලේ උලාකමින් පෝෂණ අවශ්‍යතා සපුරා ගනියි.

# අඩ සියුම් ක්‍රමය
# Semi Intensive System.

- රාත්‍රී කාලයේ ලැගීමට ගාලක් භාවිතා කෙරේ.
- ඉඩම් සීමිත ප්‍රදේශවල හා බෝග වගා බහුලව සිදුවන ප්‍රදේශවල මෙම ක්‍රමය සුලබව දැකිය හැකිය.
- ගාල් කර තබන අවස්ථාවේ දී අමතර ආහාර හා සාන්ද්‍ර ආහාර ආදිය  සපයන නිසා නිදැලි ක්‍රමයට වඩා කිරි නිෂ්පාදනය වැඩිය.
- අඩු ශ්‍රමයක් වැය වීම මෙම ක්‍රමයේ වාසියකි.



ගවයින් දිවා කාලයේ එළිමහනේ දිගේලි කර තැබීම හෝ නිදැල්ලේ උලා කෑමට ඉඩ සැලැස්වීම සිදුවේ.

# සියුම් ක්‍රමය

- ❖ ආහාර ජලය හා සතුන්ට අවශ්‍ය සියළු පහසුකම් නිවාස තුළදීම සපයනු ලබයි.
- ❖ දිවා හා රාත්‍රී කාලය මුළුල්ලේ ආහාර හා ජලය සැපයීම සිදුකරනු ලැබේ.
- ❖ එක් එක් වර්ධක අවස්ථාවල සතුන් වෙන් වෙන්ව නිවාස තුළ ඇති කිරීමට අවස්ථාව සැලසේ.
- ❖ ගවයින්ට පරිසරයෙන් ඇතිවන අහිතකර බලපෑම් අවමකර වැඩි නිෂ්පාදනයක් ලබා දෙන දෙනුන් ඇති කිරීම සුදුසු ක්‍රමයක් ලෙස සැලකේ.



- ➢ මෙම ක්‍රමයේදී සතුන් පූර්ණ කාලීනව නිවසක් තුළ ඇති කරනු ලබයි.

# ගව නිවාස

ගව පාලනයේ දී ගව නිවාස ඉතා වැදගත් ස්ථානයක් ගනියි. ගවයින්ට නිවාස සැපයීමේ පරමාර්ථ පහත දක්වා ඇත.

- අව්ව, වැස්ස, සුළං ආදී අහිතකර කාලගුණික තත්ත්ව වලින් ගවයන් ආරක්ෂා කර ගැනීම
- පැටවුන් හා දෙනුන්ට ඇති විය හැකි රෝග වලින් ආරක්ෂා කර ගැනීම
- සුව පහසුව ලබා දීම
- සොර සතුරු උවදුරු වලින් ආරක්ෂා කර ගැනීමට හැකි වීම
- රාත්‍රිය මුළුල්ලේම ආහාර හා ජලය සැපයීමේ පහසුව
- සතුන් පිරිසිදුව තබාගත ගැනීමට හැකි වීම
- ගොම මුත්‍රා ආදිය පහසුවෙන් ඉවත් කිරීමට හැකි වීම
- සතුන් පිළිබද හොඳ අවධානයක් යොමු කිරීමට හැකි වීම
- පිරිසිදු කිරි නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා

## ගව නිවාසයක තිබිය යුතු අවශ්‍යතා

ගවයන් සඳහා සපයන නිවාසයක් පහත අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි ඉදි කිරීම වැදගත් වේ.

- ආහාර සැපයීම සඳහා ස්ථානයක්
- අඛණ්ඩ ව ජලය සැපයිය හැකි ක්‍රමයක්
- සතුන්ට සුව පහසුව වැතිරී සිටීමට ස්ථානයක්
- ගොම හා මූත්‍ර ඉවත් කිරීමට සුදුසු කාණුවක්
- පැටවුන් තැබීමට සුදුසු ස්ථානයක්
- නැම්බියන් සදහා සුදුසු ඉඩක්
- කාලගුණික තත්ත්ව වලින් ආරක්ෂා වීමට සුදුසු වහලක්
- සතුන් වෙන් කරන වැට
- ආහාර වැට
- ප්‍රසූත කොටුවක්
- පැටවුන් සදහා කොටු

# ගවයින්ට නිවාස සැපයීමේදී සැලකිය යුතු කරුණු

- ගව නිවාසයක් පිහිටුවන ස්ථානය
- නිවාස ගොඩනැගීම සඳහා යොදා ගනු ලබන ද්‍රව්‍ය
- ගව නිවාසයක ඉඩ ප්‍රමාණ වෙන් කිරීම

විවිධ වර්ධක අවධිය අනුව ගවයන්ට ලබාදිය යුතු ඉඩ ප්‍රමාණ වෙනස් වේ.
පොදු වේ සතුන් ගැටගසා තබන නිවාස වල තිබිය යුතු ඉඩ ප්‍රමාණයන් පහත ආකාර වේ

| | |
|---|---|
| • ආහාර සැපයීම සඳහා වේදිකාව | 1.2 - 1.35 m |
| • එක් සතෙකු සඳහා දිග | 1.35 - 1.5 m |
| • එක් සතෙකු සඳහා පළල | 1.05 - 1.2 m |
| • ගොම කාණුවේ පළල | 30 cm |
| • පැටව් තබන වේදිකාව | 1.2 - 1.35 m |
| • පැටවුන් සඳහා | $0.75 \times 1.5\ m^2$ |
| • කිරි දෙනුන් සඳහා | $1.2 \times 2.8\ m^2$ |

# සියුම් හා අඩසියුම් ක්‍රමයට කිරි ගවයින් ඇති කිරීමේදී ගැනෙන නිවාස ආකාර 2කි

1. සතුන් බැඳ තබන නිවාස (Tie - up housing)
2. නිදහස් ක්‍රමය (Loose barn system)

සතුන් බැඳ තබන නිවාස (Tie - up housing)

1. තනි පේළි ක්‍රමය

2 දෙපේළි ක්‍රමය

# තනි පේළි ක්‍රමය

1. ආහාර දමන කොටස
2. ජල භාජන
3. සතා ලගින කොටස
4. ගොම කාණුව
5. ඇවිදින වේදිකාව



# දෙපේළි ක්‍රමය

- හිසට හිස ක්‍රමය



- වලිගයට වලිගය ක්‍රමය



# 02. නිදහස් ක්‍රමය Loose barn



# ගව දෙනුන් පාලනය

## නැම්බියන් පාලනය

- ❖ නැම්බියක් ගැබ් ගැන්වීම සඳහා එම නැම්බිය ලිංගික පරිණතියට හෙවත් යෞවනෝදයට පත්විය යුතු යි
- ❖ ගවයන්ගේ ගැහැණු සතුන් ලිංගික පරිණතියට පත්වන වයස ඔවුන් ගේ සම්භවය අනුව වෙනස් වේ.
- ❖ යුරෝපීය වර්ග හා යුරෝපීය දෙමුහුම් සතුන් මාස 8-12 දීත් ඉන්දීය හා ඉන්දීය දෙමුහුම් සතුන් මාස 20-25 දීත් ලිංගික පරිණතියට පත් වේ
- ❖ එවැනි නැම්බියන් පට්ටියට දැමිය යුත්තේ පරිණත ශරීර බරින් 60-65% වූ පසුවයි
- ❖ එම බරට පැමිණි නැම්බියන් මද ලක්ෂණ (පට්ටි ලකුණු) පෙන්වූ විගස පට්ටියට දැමීම සිදු කළ යුතුයි.

# මද චක්‍රය

❖ ලිංගික පරිණතියට පත් නැම්බියන් ගේ ශරීරයේ නිපදවන හෝමෝනවල බලපෑම නිසා ප්‍රජනක පද්ධතියේ ඇති ඩිම්බ කෝෂ මගින් ඩිම්බයක් බැගින් මුදා හැරේ.

❖ එය ඩිම්බ ප්‍රණාලය ඔස්සේ පැමිණෙන අතර ශුක්‍රාණුවක් මගින් සංසේචනය නොවූයේ නම් දින ගණනාවකට පසු විනාශ වේ

❖ ඒ සමග ම ඩිම්බ කෝෂය මගින් නැවත ඩිම්බයක් මෝරා මුදා හැරේ.

❖ මෙය දින 21කට වරක් චක්‍රාණුකූල ව සිදුවන ක්‍රියාවලියකි.

❖ එය බාහිරින් පෙන්වන්නේ මද ලක්ෂණ මගින් වේ.

❖ මෙසේ මද ලක්ෂණ පෙන්නුම් කරන චක්‍රාණුකූල ක්‍රියාවලිය මද චක්‍රය වේ

## මද ලක්ෂණ (පට්ටි ලකුණු)

- ආහාර ගැනීම අඩු කිරීම
- නිතර නිතර කෑ ගැසීම
- යෝනිය ඉදිමී රතු පැහැති වීම
- වරින් වර කොන්ද නමා මුත්‍රා කිරීම
- නොසන්සුන් බවක් දැක්වීම
- පැහැදිලි අවර්ණ උකු ස්‍රාවයක් යෝනියෙන් වැගිරීම
- වෙනත් සතුන්ට තම පිට උඩ නැගීමට ඉඩ දීම
- පිටමත අත තැබූ විට නොසෙල් වී සිටීම
- උකුල් බන්ධන ලිහිල් වීම

ගැබ් ගැන්වීම

මද ලක්ෂණ සැලකිල්ලට ගෙන සතුන් ගැබ් ගැන්වීම සිදු කෙරේ. ගැබ් ගැන්වීම ප්‍රධාන ආකාර දෙකකට සිදු කළ හැකි ය.

- ස්වාභාවික සිංචනය
- කෘත්‍රිම සිංචනය

1. ස්වභාවික සිංචනය
2. කෘත්‍රිම සිංචනය

## ස්වාභාවික සිංචනයේ වාසි

- පහසු ක්‍රමයක් වීම
- පටිටි ලකුණු පරික්ෂා කිරීම අවශ්‍ය නොවීම
- මදයට පැමිණි පටිටි ලකුණු නොපෙන්වන සතුන්ට වුවද යොදාගත හැකි වීම

## කෘත්‍රිම සිංචනයේ වාසි

- උසස් වර්ගයේ එක් සතෙකුගේ ශුක්‍රාණු ගබඩා කොට වසර ගණනාවක් භාවිත කළහැකි වීම
- උසස් ගතිගුණ ඇති ආබාධිත පිරිමි සතෙකු වුවද අභිජනන කාර්යයට යොදා ගත හැකි වීම
- ලෝකයේ කුමන රටක හෝ සිටින උසස් නිෂ්පාදන සහිත සතුන්ගේ ශුක්‍රාණු ආනයනය කොට දේශීය ව උසස් ලක්ෂණ සහිත සතුන් බිහිකර ගැනීමට හැකි වීම
- ගොවියාට අවශ්‍ය පරිදි පරිසරයට ගැළපෙන උසස් නිෂ්පාදනයක් සහිත පිරිමි සතෙකුගේ ශුක්‍රාණු යොදාගත හැකි වීම
- ලිංගික රෝග බෝවීමේ අවදානම අඩු වීම
- අභිජනනය සිදුවීම පාලනය කරගත හැකි වීම
- එක් පුං ගවයකුගේ ශුක්‍රාණු වලින් ගැහැණු සතුන් විශාල සංඛ්‍යාවක් සිංචනය කළ හැකි වීම

# කෘත්‍රිම සිංචනයේ අවාසි

- ශුක්‍රාණු එකතු කිරීම, තනුක කිරීම, ගබඩා කිරීම, සිංචනය කිරීම වැනි සෑම පියවරකටම විශේෂඥ දැනුම අවශ්‍ය වේ
- මදයට පැමිණිය ද පට්ටි ලකුණු නොපෙන්වන  සතුන්ට යොදාගත නො හැකි ය
- නිදැලි ක්‍රමයේදී පට්ටි ලකුණු හඳුනා ගැනීම අපහසු නිසා නිදැලි ක්‍රමයට යොදා ගැනීම අපහසුවීම
- පට්ටි ලකුණු පරීක්ෂාව නිවැරදි ව සිදු නොවීමෙන් සිංචනය අසාර්ථක විය හැකි ය
- ශුක්‍රාණු ආනයනය කිරීමේ දී අධික මිලක් ගෙවීමට සිදු වේ.

# ගැබ් දෙනුන් පාලනය

- කෘත්‍රිම සිංචනය සිදු කොට හෝ ස්වාභාවික සිංචනයට ලක්කොට දින 18-21 අතර නැවත මද ලක්ෂණ පෙන්වන්නේ දැයි පරීක්ෂාවෙන් සිටිය යුතුයි.
- නැවත මද ලක්ෂණ නොපෙන්වුවහොත් සිංචනය සාර්ථක වී ඇතැයි සිතිය හැකි ය.
- සිංචනය කොට මාස 02කට පසුව පශු වෛද්‍යවරයකු ලවා ගැබ පරීක්ෂා කරවා ගැනීමෙන් ගැබ් ගෙන ඇති බව සැක හැර දැනගත හැකි ය
- ගව දෙනකගේ ගැබ් කාලය දින 280 + 5 වේ.

- ගැබ් ගත්වා පළමු දින දෙක තුන තද අව්වේ ගැට ගසා තැබීම හෝ දිවීමට සැලැස්වීම ආදිය සිදු නොකොට සතා පීඩාවක් ඇති නොවන ලෙස තැබිය යුතුය.
- ගාලේම ගැට ගසා තබා ගන්නේ නම් වඩාත් සුදුසුය.
- ගැබ් ගත්වා මුල් කාලයේ ගව දෙන සාමාන්‍ය ලෙස පෝෂණය කළ හැකි ය.
- නමුත් ගැබ වර්ධනයත් සමග පෝෂණ තත්ත්වය වැඩි කළ යුතු ය.
- පැටවා ලැබීමට මාස දෙකකට පෙර කාලය ඉතා වැදගත් කාලයක් වෙයි.
- කිරි දෙනක් නම් මෙම කාලයේ කිරි දෙවීම නතර කළ යුතුවේ. ඒනිසා මෙම කාලය වියළි කාලය" ලෙස හැඳින්වේ.
- වියළි කාලය තුළ පැටවාගේ වර්ධනයෙන් 2/3 පමණ සිදුවන බැවින් දෙනට වැඩි පෝෂණයක් ලබාදිය යුතු යි.
- නමුත් කලලයේ වර්ධනය සමග ආමාශය හැකිලෙන බැවින් ගත හැකි ආහාර ප්‍රමාණය අඩු වේ.

## ප්‍රසූති ලක්ෂණ

ප්‍රසුතිය ආසන්න වනවිට පහත සදහන් ලක්ෂණ දැකිය හැකි වෙයි.

- සතා වරින්වර ලැගීම හා නැගිට සිටිම
- නිතර නිතර මුත්‍රා කිරීමට තැත් කිරිම
- සතා නොසන්සුන් වීම
- දියර බෑගය පිටතට නෙරා ඒම
- පැටවා පිටතට එවීමට තැටමීම

# ප්‍රසූතිය.



# පැටවුන් පාලනය.

පැටවුන් පාලනය කරන ක්‍රම තුනකි

1 පැටවාට අවශ්‍ය වන කිරි දිගට ම දෙනුන්ගෙන් උරා බීමට සැලැස්වීම
2 ඉපදුනු දිනම මවගෙන් වෙන්කොට අවශ්‍ය කිරි ප්‍රමාණය දොවා පෙවීම
3 පළමු දින තුන මවගෙන් කිරි උරා බීමට සලස්වා පසුව මවගෙන් වෙන් කිරීම





මින් පළමු ක්‍රමය ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ගොවින් බොහොමයක් යොදාගනු ලබන අතර දෙවන හා තුන්වන ක්‍රම විශාල වශයෙන් සතුන් ඇති කරන ගොවිපොළවල අනුගමනය කරනු ලැබේ.

ඉහත කවර ක්‍රමය භාවිත කළද පැටවුන් පෝෂණයේ දී පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගත යුතු ය.

- මුල් දින තුන තුළ පැටවුන්ට ප්‍රමාණවත් පරිදි මුල්කිරි (කොලෙස්ට්‍රම්) ලබා දිය යුතු යි.
- හතරවන දින සිට පැටවුන්ට සාමාන්‍ය කිරි ලබා දෙනු ලැබේ ලබාදෙන කිරි ප්‍රමාණය පැටවාගේ උපත් බරින් 8-10 % විය යුතු ය.
- වයස මාස 2 - 3 වනවිට කිරි වැරීම සිදු කළ යුතු යි. කිරි වරන විට පැටියාගේ බර උපත් බර මෙන් දෙගුණයක් හෝ වැඩුණු පසු දේහ බරින් (10 - 12)% ක් ලඟා වූ විට විය යුතු ය.
- කිරි වරන අවස්ථාව වන විට පැටවා හොඳින් සාන්ද්‍ර ආහාර වලට (පැටව් කෑම) හා තෘණ කෑමට හුරු වී සිටිය යුතු ය.
- කිරි වරන තුරු පැටවුන් වෙන් වෙන් ව පැටවු කොටුවල ඇති කළ යුතු ය.
- කිරි වැරීමෙන් පසු පැටවුන් සමූහ කොටු වලට ඇතුලත් කළ යුතු ය.


Thank You
Contact through
sajeeee89@gmail.com